# ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා උපදෙස් හා රැගෙන ආ යුතු ලිපි ලේඛන

**ඔබගේ අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථම පහත උපදෙස් කියවන්න.**

- තනි පුද්ගල ව්‍යාපාර නම ඉල්ලුම්පත්‍රය - (ව්.ප.) ආර් 1 ආකෘති පත්‍රය
- හවුල් ව්‍යාපාර නමක් ඉල්ලුම්පත්‍රය - (ව්.ප.) ආර් 2 ආකෘති පත්‍රය.
- ව්‍යාපාර නාමය අනුමත කිරීම සිදුකරනු ලබන්නේ ප්‍රාදේශිය ලේකම්වරයා විසිනි.
- ව්‍යාපාර ස්වභාවය වෙළඳාමක්, ආනයන/අපනයනන කිරීමක් හෝ නිෂ්පාදනයක් නම් වෙළඳාම් කරනු ලබන, ආනයන/අපනයන හෝ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ පැහැදිලිව සඳහන් කළයුතුය.

**ග්‍රාම නිලධාරී වාර්තාව**

මෙය අදාල ඉල්ලුම්පත්‍රය සමඟ නිකුත් කරනු ලැබේ.
ව්‍යාපාර ස්ථානයට අදාළ වසම භාර **ග්‍රාම නිලධාරී විසින් අත්සන් කර ප්‍රාදේශීය ලේකම් අනුඅත්සන් කර තිබීම අනිවාර්ය** වේ. අදාළ **ග්‍රාම නිලධාරී වාර්තාවේ කපාහැරීම්**, මැකීම්, මකන දියර භාවිතා කිරීම් සිදුකර ඇත්නම් **එකී ස්ථානයේ ග්‍රාම නිලධාරී විසින්** සිය අත්සන යොදා නිලමුද්‍රාව තැබිය යුතුය.

**ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපත**
**(ග්‍රාම නිලධාරී /සාම විනිසුරු/දිවුරුම් කොමසාරිස් වරයෙකු** විසින් සහතික කර තිබිය යුතුය.
නැතහොත් ජාතික හැඳුනුම්පත පරීක්ෂාව සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතුය)
ඉල්ලුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය. ද්විත්ව පුරවැසිභාවය දරන්නේ නම් සනාථ කළයුතු ලියවිලි ඉදිරිපත් කළයුතුය.
විදේශ ගමන් බලපත්‍ර/රියදුරු බලපත්‍ර පිටපතක් ඉදිරිපත් කළහැක්කේ ජාතික හැඳුනුම්පත
අපහැදිලි අවස්ථාවල දී එය තහවුරු කිරීම සඳහා පමණි.
ජාතික හැඳුනුම්පත අස්ථානගත වී ඇත්නම් එකී පුද්ගලයාගේ පදිංචි වසමේ පොලිස් ස්ථානාධිපති වෙතින් ලබාගත් පොලිස් වාර්තාව ඉදිරිපත් කළයුතුය.

ජාතික හැඳුනුම්පත **නැවත ලබාගැනීම සඳහා** පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත්නම් ඒ බව සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් සහතික කර නිකුත් කරන ලද **කුවිතාන්සිය** ඉදිරිපත් කළයුතුය.

**අදාළ ව්‍යාපාර ස්ථානය තහවුරු කිරීම.**

තමාට අයත් වන්නේ නම් ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඔප්පුවේ මුල් පිටපත සමග නොතාරිස්වරයකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කල ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කළයුතුය. ජීවිත භුක්තිය පවතින අවස්ථාවක ජීවිත භුක්තිකරුගේ කැමැත්ත **දිවුරුම් ප්‍රකාශයකින් ලබාදිය යුතුය**. එමෙන්ම එම අයගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පත් පිටපතක් ද ලබාදිය යුතුය.

- බදු/කුලී ගිවිසුමක් යටතේ පවත්වාගෙන යන්නේ නම් ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ගිවිසුමේ මුල්පිටපත සමග **නොතාරිස්වරයකු** විසින් සත්‍ය පිටපතක් බවට සහතික කළ ඡායාස්ථ පිටපකක් ඉදිරිපත් කළයුතුය.බදු/කුලී ගිවිසුම් අයිතිකරුගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ/රියදුරු බලපත්‍රයේ පිටපතක් ඉදිරිපත් කළයුතුය.

- බදු අයිතිකරු සමාගමක් වන අවස්ථාවල එම සමාගමේ සහතික කරන ලද ලියාපදිංචි සහතික පිටපත ඉදිරිපත් කළයුතුය.

- අදාළ ස්ථානයේ වරිපනම් බදු තක්සේරු දැන්වීම(ආසන්නතම වර්ෂය සඳහා)

- ව්‍යාපාර ස්ථානයට අදාළ ඔප්පුව යම් බැංකුවක්/මූල්‍ය ආයතනයක් වෙත උකස් කර ඇත්නම් එකී දේපල තුළ ව්‍යාපාරය ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් විරෝධතා නොමැති බවට අදාල ආයතනයෙන් ලබාගත් ලිපිය හා එම ආයතනය විසින් සහතික කරනු ලැබූ ඡායාස්ථ පිටපතක් ඉදිරිපත් කළයුතුය.

- යම් ව්‍යාපාර ස්ථානයක් අයිතිකරුගේ කැමැත්ත මත පමණක් පවත්වාගෙන යන්නේ නම් අදාළ ඔප්පුවේ සහතික පිටපතට අමතරව එකී ව්‍යාපාර ස්ථානයේ අයිතිකරු/අයිතිකරුවන් වෙතින් ඒ සඳහා විරුද්ධත්වයක් නොමැති බවට දිවුරුම් සහතිකය එකී තැනැත්තා/තැනැත්තන්ගේ ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රයේ සහතික පිටපතක් ඉදිරිපත් කළයුතුය.

- අදාල ස්ථානයේ ආසන්න වර්ෂය සඳහා වරිපනම් බදු , තක්සේරු දැන්වීම් කොළඹ මහ නගර සභාව නාගරික සංවර්ධන අධිකාරිය /නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද ව්‍යාපාරය පවත්වා ගෙන යාමට විරුද්ධතාවයක් නොමැති බවට ඉදිරිපත් කරන ලද ලිපිය

- රූපලාවන්‍ය, වෛද්‍ය මධ්‍යස්ථාන, සුවඳ විලවුන් වර්ග අලෙවිය, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිර්දේශය /මහජන සෞඛ්‍ය පරීක්ෂක නිර්දේශය සහ වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික අවශ්‍ය වේ.

- ඉන්ධන පිරවුම්හල් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සහ නංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ එකඟතාවය අවශ්‍යවේ.

- පොලිතින්, ප්ලාස්ටික්, තීන්ත වර්ග, ඇසිඩ් නිෂ්පාදන ගබඩාකර තැබීම, අලෙවිය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්ත සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය අවශ්‍යවේ.

- දැව ආශ්‍රිත කර්මාන්ත,දැවකැපීම, දැව ප්‍රවාහනය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාවය අවශ්‍යවේ.

- මුද්‍රණාල ලියාපදිංචිය සඳහා ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිර්දේශය අවශ්‍යවේ.

- ශ්‍රමිකයන් සපයන ව්‍යාපාර සඳහා අයිතිකරුවන් නමින් ලබාගත් පොලිස් නිෂ්කාශන වර්තාව අවශ්‍යවේ.

- කාමර, නවාතැන් පහසුකම් සැපයීම, ගෙස්ට් හවුස් , සම්භාහන මධ්‍යස්ථාන සඳහා මහජන විරෝධතා නොමැති බවට ග්‍රාම නිලධාරී නිර්දේශය සහිත ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව සහ අදාල ස්ථානය සහ අයිතිකරුවන් පිළිබඳ ප්‍රදේශයේ පොලිස් ස්ථානයෙන් පොලිස් වාර්තාව.

- සත්ව ගොවිපොලවල් සඳහා පශු වෛද්‍ය නිලධාරියාගේ නිර්දේශය

- ආහාරපාන සම්බන්ධ ව්‍යාපාර කටයුතු සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්ථාව.

- පලිබෝධනාශක, කෘමිනාශක, රසායනික පොහොර අලෙවිසැල් සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය.

- යම් ආයතනයක වෙළඳ නියෝජිතයෙකු ලෙස කටයුතු කරනනේ නම් එම ආයතනයේ නියෝජිත ලෙස පත්කර ඇති බවට ලිපිය.

- යම් ව්‍යාපාරයක් ආයුර්වේදය සම්බන්ධ බෙහෙත්ශාලා, රෝහල්, චිකිත්සා ආයතන, ඔසුහල් ඖෂධ ගබඩා, පැල තවාන් හා ඒ සම්බන්ධ ව්‍යාපාරයක් නම්ම පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ එකඟතාවය තිබිය යුතුය.

- මැණික් හා ස්වර්ණාභරණ අලෙවිය, නිෂ්පාදන සම්බන්ධ ව්‍යාපාරයක් නම් ව්‍යාපාර හිමිකරුගේ පෞද්ගලික නමට නිකුත් කරන ලද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිර්දේශය සහිතව යොමුකළ යුතුය.

- ව්‍යාපරයට අදාල වෘත්තීය සුදුසකම් ලබාගත යුතුයැයි හැඟෙන අවස්ථාවල එකී වෘත්තීය සුදුසකම් සනාථ කරන සහතික පිටපත් ලබාදිය යුතුය.

- සිගරට්, පයිප්ප දුම්කොළ, සුරුට්ටු, බීඩි සඳහා වූ අමුද්‍රව්‍ය , නිම්භාණ්ඩ නිෂ්පාදනය, ගබඩා කිරීම, ආනයනය, අපනයනය සඳහා සුරාබදු කොමසාරිස්ගේ එකඟතාවය සහිතව යොමුකළ යුතුය.

- ඖෂධ ශාලා සඳහා වෛද්‍ය තාක්ෂණ හා සැපයීම් අංශයේ එකඟතාවය හා ඖෂධවේදීන් සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය.

- උපදේශන හා සම්බන්ධ ව්‍යාපාර ලියාපදිංචිය සඳහා අදාල ක්ෂේත්‍රය සම්බන්ධව වෘත්තීය සුදුසුකම් ලබා තිබිය යුතුය.

- පෙර පාසල් සඳහා බස්නාහිර පළාත් පෙර පාසල් අධ්‍යක්ෂගේ නිර්දේශය අවශ්‍යවේ.

- දිවාසුරැකුම් මධ්‍යස්ථාන අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සේවයේ නියුතු මුල් ළමාවිය සංවර්ධන සහකාරගේ නිර්දේශය ප්‍රාදේශීය ලේකම් අනු අත්සනින් යුතුව ලබාගත යුතුවේ.

- ආරම්භක ප්‍රාග්ධනයට අදාලව **දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුය**

- ව්‍යාපාර හිමිකරුගේ පදිංචිය වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක නම්, පදිංචිය තහවුරු කර ගැනීම සඳහා **D.S.04** ආකෘතිය මඟින් පදිංචිය තහවුරු කිරීම සිදුකළ යුතුය.

- ව්‍යාපාරයක් ආරම්භ කර දින 14 ක් ඇතුලත හෝ ප්‍රාදේශිය ලේකම් විසින් ඉඩදෙනු ලබන කාලසීමාවක් ඇතුලත ලියාපදිංචිය සිදුකළයුතු අතර නියමිත කාලය ඉකුත් වී ඉදිරිපත් කරන අයදුම්පත් සඳහා **ප්‍රමාද ගාස්තුවක්** අයකරනු ලබන අතර, එකී ගාස්තුව තීරණය කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් පමණි.

**ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා ආරම්භක ප්‍රාග්ධනයට අයකරන ගාස්තුව**

- **අරමභක ප්‍රාග්ධනය රු. 300,000/-ට අඩු - රු.500/-**
- **ආරමභක ප්‍රාග්ධනය රු.300,001/- සිට රු.500,000/- දක්වා - රු.1,000/-**
- **ආරමභක ප්‍රාග්ධනය රු.500,001/-ට වැඩි - රු.2500/-**

- **රජයේ වැඩ කරන අගහරුවදා සහ බ්‍රහස්පතින්දා පමණක් පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා අයදුම්පත් භාරගැනීම සිදු කරයි.**

- **සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා සති දෙකක කාලයක් ගත වන බව කාරුණිකව දැනුම් දෙමි.**

**දුරකථන අංකය පොදු 011 -2437247** **ප්‍රාදේශිය ලේකම් - කොළඹ**